# සීමාසහිත ශ්‍රී ලංකා රජයේ
# වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව (STC)

**අංක 100, නවම් මාවත, කොළඹ 02.**

## තොරතුරු තාක්ෂණ දෘඪාංග තාක්ෂණ ශිල්පී තනතුර

**(PL 02) - පුරප්පාඩු ගණන - 03**

අප ආයතනය විසින් ප්‍රතිඵල කෙරෙහි නැඹුරු හා ස්වයං උද්යෝගී සහ කාර්යශූර, ඍජු හා අවංක, කැපවීමෙන් යුත්, විශිෂ්ට හා පූර්ණ තරගකාරිත්ව හැකියාව ඇති අයවළුන් පහත දැක්වෙන තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට අපේක්ෂා කෙරේ.

**රැකියා විස්තරය :**

(අ) ආයතනයේ දෘඩාංග සංඝටක සහ උපකරණ රැකබලා ගැනීම හා නඩත්තු කිරීම කෙරෙහි වගකීම් භාරය දැරිය යුතුය.

(ආ) මෘදුකාංග සංවර්ධනය කෙරෙහි අදාළ වන දෘඩාංග සංඝටක කොටස් යාවත්කාලීන කිරීම සඳහා වන වගකීම් භාරය දැරිය යුතුය.

(ඇ) ආයතනයේ, තොරතුරු පද්ධතිය යථාපරිදි ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීමට අදාළ වන සංස්ථාව සතු දෘඩාංග සංඝටක හා අවයව කොටස්, නිසි පරිදි පවත්වාගෙන යාම පිළිබඳ වගකීම් භාරය දැරිය යුතුය.

(ඈ) අධීක්ෂකවරුන් විසින් පවරනු ලබන වෙනත් රාජකාරි ඉටුකිරීම පිළිබඳ වගකීම් භාරය දැරිය යුතුය.

**සුදුසුකම් :**

**බාහිර අපේක්ෂකයින් :**

එක් එක් තනතුර කෙරෙහි අදාළ වන ක්ෂේත්‍රයක, තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් පිළිගනු ලබන තාක්ෂණික හා වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කරනු ලැබූ, ජාතික වෘත්තීය කුසලතා 2 මට්ටමට නොඅඩු, (NVQ Level 2), ප්‍රවීණතා / නිපුණතා සහතිකයක් ලබා තිබිය යුතුය.

**පොදු කොන්දේසි :**

**වයස :** අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයින්හට බල නොපානු ඇත.

**වෙනත් කරුණු හා කාරණා**

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(ii) දිවයිනේ ඕනෑම පළාතක / ප්‍රදේශයක සේවය කිරීම සඳහා සහ තනතුරට පැවරෙන රාජකාරි මැනවින් ඉටුකිරීම සඳහා සුදුසු කායික හා මානසික සුවතාවයෙන් හා යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

(iii) අනර්ඝ හා විශිෂ්ට චරිත ස්වභාවයකින් යුක්ත විය යුතුය.

- වැටුප් පරිමාණය : (2021-01-01 වන දිනට)

(PL 2 රු. 25,750/= (රු. 270/=X18) රු. 30,610/=

මූලික වැටුප් ලක්ෂය : ඉහත තනතුර සඳහා, රුපියල් 25,750/= ක් වනු ඇත.

- **අයදුම්කළ යුතු පිළිවෙළ :**

අයදුම්කරුවන් විසින්, සම්පූර්ණ ජීව දත්ත තොරතුරු විස්තර සහිත සිය අයදුම්පත්, ස්වකීය විද්‍යාර්ථී, වෘත්තියවේදී සහතිකවල හා පළපුරුද්ද පිළිබඳ සියලු සහතිකවල පිටපත්ද සමග ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනද, දුරකථන අංකද සහිතව **2021 මාර්තු මස 15 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ** ලේඛනගත කළ තැපැලෙන්, එවිය යුතු වන අතර, අයදුම්පත් බහා එවනු ලබා ලිපිකවරයේ, වම්පස ඉහළ කෙළවරේ, අයදුම්කරනු ලබන තනතුර, පැහැදිලිව සටහන් කළ යුතුය. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනෙන් පසුව ලැබෙන ප්‍රමාද අයදුම්පත් පිළිබඳව සලකා බලනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව, ප්‍රතික්ෂේප කරනු ලැබේ.


**සභාපති,**
**සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව**
**අංක 100, නවම් මාවත, කොළඹ 02.**

**දුරකථන** : 011-2384608 / 011-2422341 / 2440880
**ෆැක්ස්** : 011-2447970
**ඊමේල්** : lankagen@sltnet.lk
**වෙබ් අඩවිය** : www.stc.lk